**මාතලේ ප්‍රාදේශීය සභාව - 2021**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

මාතලේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මාතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**----------------------------------------------------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ

වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**-----------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ සිදු වූ ඉඩම් හුවමාරුවලින් ලැබියයුතු මුද්දර ගාස්තු ආදායම් වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම ලෙස සළකනු ලබන බව ගිණුම් ප්‍රතිපත්තිවල දක්වා තිබුණ ද, රු.50,000,000 ක ඇස්තමේන්තුගත මුද්දර ගාස්තු ආදායම, වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම මුද්දර ගාස්තු ආදායම් කිසිවක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන ද නොතිබුණි. | රෙජිස්ටාර් කාර්යාල මඟින් මාසිකව ලබාදෙන වාර්තා නොලැබීම හේතුවෙන් ඇස්තමේන්තුගත මුද්දර ගාස්තු ආදායම අවසන් ගිණුම්වල ඇතුළත් කළ බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය . |
| (ආ) | පළාපත්වල මාතෘ හා සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයේ හා ප්‍රජා ශාලාවේ රු.41,691,510 ක නිමි වැඩ වටිනාකම රු.46,629,525 ක් ලෙස ප්‍රාග්ධනිත කිරීමෙන් ස්ථාවර වත්කම් වටිනාකම රු.4,938,015 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඇ) | මඩවල පොදු වැසිකිළිය ඉදිකිරීම සඳහා ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී වැය කරන ලද එකතුව රු.2,945,520 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | |
| (ඈ) | ඉඩම් කොටස් 02 ක රු.90,000 ක වටිනාකම ඉඩම් හා ගොඩනැඟිලි යටතේ දෙවරක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු.90,000 ක් වැඩියෙන් දැක්වේ. | | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය . |
| (ඉ) | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලේ ශේෂ සනාථ කිරීමේ ලිපියට අනුව, පෙර වර්ෂ වලදී එම අරමුදලට වැඩිපුර ගෙවා තිබුණු සේ ඉදිරියට ගෙන එන ලද රු.186,737 ක ශේෂය ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි . | | |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල පාරිභෝගිකයින්ගෙන් අයවිය යුතුව තිබුණු රු.80,000 ක ජල මනු ගාස්තු ණයගැතියන් යටතේ දක්වා නොතිබුණි. | | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය . |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු රු.389,605 ක දැන්වීම් පුවරු ආදායම් ගිණුම්ගත කර හෝ අයකර හෝ නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | |

**2.** **මූල්‍ය සමාලෝචනය**
-----------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.55,243,576 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.59,915,854ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**
------------------------

**2.2.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**
---------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් අක්‍රීය තත්ත්වයේ පැවති ජල යෝජනා ක්‍රම 5 ක වසර 6 සිට 11 අතර කාල පරාසයක හිඟ හිටි රු.1,212,959 ක ජල ගාස්තු අයකරගෙන නොතිබුණු අතර ජල සැපයුම් විසන්ධි කළ ජල පාරිභෝගිකයින් 46 දෙනෙකුගෙන් වසර 2 සිට වසර 10 අතර කාල පරාසයක හිඟ හිටි රු.217,292 ක ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | ඇප තැන්පත් වලින් හා නීති මඟින් කටයුතු කර හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු රු.2,933,000 ක් විය . | මුද්දර ගාස්තු සම්බන්ධ වගකීම් දරන බලධාරීන් වෙත ලිඛිතව හා අදාල ආයතන වෙත ගොස් වාර්තා ලබාදී ඇතත්, එම මුදල් සභාව වෙත ලබාදී නොමැත. | හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

2.2.2 අධිභාර
---------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මා විසින් ඉකුත් | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන |

| | | |
|---|---|---|
| වර්ෂවලදී පනවන ලද අධිභාරවලට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට රු.1,627,825 ක මුදලක් අයකර ගැනීමට තිබුණි . | නඩු පවරා අධිභාර මුදල අයකර ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව. | අනුව කටයුතු කර අධිභාර අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 5 ක එකතුව රු.73,189,895 ක් අයකරගෙන නොතිබුණු අතර, ඊට අය නොකර පවතින කාලය වසර 1 ට අඩු ශේෂය රු. 68,840,206 ක් ද වසර 1 ට වැඩි හා 5 ට අඩු ශේෂය රු.3,572,936, ක් ද වසර 5 ට වැඩි ශේෂය රු.776,753 ක්ද ඇතුළත්ව තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව | ලැබියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි ශේෂය රු.15,178,079 ක් නිරවුල් කර නොතිබුණු අතර, ඊට නිරවුල් නොකර පවතින කාලය වසර 1 ට අඩු ශේෂය රු. 14,972,078 ක් ද, වසර 1 ට වැඩි හා වසර 5 ට අඩු ශේෂය රු.206,001 ක් ද ඇතුළත්ව තිබුණි. | ගෙවියයුතු ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළයුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාල, පුස්තකාල, පොදු වැසිකිලි හා සුසාන භූමි වැනි සභාවේ විවිධ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන භූමි ප්‍රමාණය හඳුනා නොගත් ඉඩම් 38 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | මෙම ඉඩම් රජයේ ඉඩම් වන අතර, අදාල ආයතන වලින් පවරා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. | ඉඩම් සඳහා අදාළ ඔප්පු හෝ පැවරුම් නියෝග ලබාගත යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාන මාරුවී ගොස් වසර 1 ත් වසර 2 ½ ත් අතර කාල පරාසයක් ගතවී තිබුණු නිලධාරීන් 4 දෙනෙකුගේ හා ඉකුත් වර්ෂයේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගේ ආපදා ණය, උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ශේෂ එකතුව රු.835,227 ක් නිරවුල් කරගෙන නොතිබුණි. | ස්ථාන මාරුවී ගිය හා පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ සම්බන්ධ නොගැලපීම් පවතින අතර, සේවය හැර ගිය නිලධාරීයාගේ ණය සම්බන්ධව නීති මඟින් කටයුතු කරන බව. | හිඟ ණය ශේෂ නිරවුල් කළයුතුය. |
| (ආ) | ස්ථාන මාරුවී පැමිණ වසර 2 ත් වසර 9 ත් අතර කාල පරාසයක් ගතවූ නිලධාරීන් 7 දෙනෙකුගේ එකතුව රු.1,400,841 ක ආපදා ණය, උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ශේෂ නිරවුල් කර නොතිබුණු අතර, එම නිලධාරීන්ගෙන් අයකර ගන්නා ලද එකතුව රු.751,867 ක වාරික මුදල් පොදු තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ සම්බන්ධව ප්‍රධාන ලේකම්ගේ වාර්තාවල නොගැලපීමක් හේතුවෙන් මෙම ණය ශේෂ නිරවුල් කිරීමට නොහැකි වී ඇත. | අයකරගත් ණය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |